Mathematics.lk
FOR FUTURE EDUCATION IN SRI LANKA

Sri Lanka First and Only Mathematics Educational Website

Visit Our Website for More;

© LAHIRU KADURUGAMUWA EDUCATIONAL FOUNDATION

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2018<br>**උපකාරක ප්‍රශ්න පත්‍රය** | | | |
| ශ්‍රේණිය: | විෂය: **සිංහල භාෂාව හා සාහිත්‍යය** | පත්‍රය: I | කාලය: 1 |
| නම:...................................................................... | | | |

සැලකිය යුතුයි :

* සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තර තෝරන්න.

**කාලය : පැය එකයි**

නම /විභාග අංකය : ..........................................................................................

* අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ** අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

(1) කලක් **එක පතේ කෑ** අය. දුන් නයින් පොළඟුන් සේ එකිනෙකාට එරෙහි ව අවි අමෝරා ගනිති.

(1) එක් ව ආහාර ගත් (2) අහල පහළ ජීවත් වූ

(3) එකට දිවි ගෙවූ (4) දැඩි සේ මිතුරුව සිටි

(2) නිවසට පැමිණි ලොකු පුතා **තකහණියේ** ම ආපසු යෑම ගැන දෙමවුපියෝ සතුටු නොවූහ.

(1) ඉක්මනින් ම (2) තනිව ම

(3) හදිසියේ ම (4) කේන්තියෙන් ම

(3) රටේ පොදු ප්‍රශ්නවල දී **කර බා ගෙන සිටීම** උගත්කමේ ලක්ෂණයක් නොවේ.

(1) ඉවසාගෙන සිටීම (2) නිහඬ ව සිටීම

(3) ඇහුම් කන් දීම (4) සාවධානයෙන් සිටීම

* අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන් මුද්‍රිත** කොටස් වෙනුවට යෙදිය හැකි වඩාත් ම ගැළපෙන තනි පදය තෝරන්න.

(4) බොහෝ කලකෝලාහල ඇති වන්නේ **සිතෙහි හට ගන්නා කලබලකාරී ස්වභාවය** පාලනය කළ නොහැකි වීම නිසා ය.

(1) ආවේගය (2) ප්‍රවේගය (3) බලවේගය (4) සංවේගය

(5) අනගාරික ධර්මපාල තුමා රටවැසියන් දුරාචාරයෙන් ගොඩ ගනු **වස් කිසිවකුට දෙවෙනි නොවන** යුග මෙහෙවරක් ඉටු කෙළේ ය.

(1) අමරණීය (2) අද්විතීය (3) අපරිමිත (4) අනභිභවනීය

(6) වන පෙතට පිවිසෙත් ම විහඟුන් නඟන **සිත් ඇදගන්නා** ගී රාවය අප තුළ ජනිත කළේ අපූර්ව චමත්කාරයකි.

(1) කන්කලු (2) නෙත්කලු (3) ඉමිහිරි (4) මනහර

mathematics.lk

(7) අකාරාදි පිළිවෙළ නිවැරදි ව දක්වෙන පද පේළිය තෝරන්න.

(1) විෂ්කම්භ, මනෝසය, විශුද්ධ, සද්භාව
(2) උපෝසථ, දුර්මුඛ, හස්තසාර, සත්භාව
(3) අභිජනන, අර්බුදය, කෞශල්‍යය, ශිඛාමණි
(4) ගර්ජනය, උපස්ථාන, සෘද්ධිමත්, විසර්ජන

(8) හැම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදුණු පද පේළිය තෝරන්න.

(1) සමස්තය, ස්තූපය, ආස්වාදය, හස්මාවශේෂ
(2) ප්‍රබන්ධ, භූවාර්ථ, ගැටළුව, සැණකෙළිය
(3) සජ්ඣායනාව, සංඝායනාව, උද්ඝෝෂණ, සංඛ්‍යාව
(4) දූරකතනය, පරිච්ඡේදය, අසාර්ථක, සංශෝධන

(9) පහත දී ඇති එක් එක් පේළියේ ඇති පදවල දෙවෙනි අක්ෂරයෙහි පිළිවෙළින්, කෙටි ඉස්පිල්ල, රකාරාංශය, ගැටය සහිත ඇලපිල්ල හා ගයනුකිත්ත යෙදුණු වරණය තෝරන්න.

(1) දූරීභූත, සංක්‍රමණ, ශාස්තෘන්, දෘෂ්ටිගෝචර
(2) කඨින, ආක්‍රමණ, නිකෘෂ්ට, අලෞකික
(3) ගෝලීයකරණය, අගෞරව, වක්‍රාකාර, විජෘම්භණ
(4) යාදින්න, ප්‍රමුදිත, සංදෘෂ්ටික, දිවෙ

(10) (1) තීරුවේ සඳහන් සමාස වර්ග සඳහා (2) තීරුවේ ඇති උදාහරණ පිළිවෙළින් දක්වෙන වරණය තෝරන්න.

| (1) | (2) |
|---|---|
| 1. විභක්ති සමාසය | A ඉමිහිරි, අනලස්, ප්‍රබල |
| 2. අව්‍යය සමාසය | B සියපත්, බටහිර, සහසැස් |
| 3. විශේෂණ සමාසය | C කම්කරු, මවුකිරි, වනමල් |
| 4. අන්‍යාර්ථ සමාසය | D තුන්බිය, සිනාමල්, සුදුකොඩි |

(1) A, B,C,D (2) C, A, B, D (3) D, C, A, B (4) C, A, D, B

(11) එකෙණෙහි පුතකු වඩා ගත් ගැහැනියක් ඇතු කෙරෙහි කළ භයින් වඩා ගත් පුතු ස්වාමි දරුවන් හා ඇතු හා දෙමැදට දමා පියා පලා ගියා. ඒ ඇත් තෙමේ කුමාරයා කාරා නික්මිණ.

ඉහත ඡේදයේ උක්ත පද වන්නේ

(1) ඇතු, ස්වාමි දරුවන් (2) ගැහැනියක්, පුතකු
(3) ගැහැනියක්, ඇත්තෙමේ (4) කුමාරයා, පුතු

(12) දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් ළං වන කාර්යයන් සමග බැඳී නොපවත්නා පද පේළිය තෝරන්න.

(1) කොට්ටය, කළුලෑල්ල, ගල්කුර, රටහුනු (2) අඩුමිටිය, කියත, නියන, බුරුමය
(3) හැන්ද, පිඟාන, කෝප්පය, තසිම (4) පන්දුව, විකට්ටුව, අත් ආවරණ, පිත්ත

mathematics.lk

- අංක 13 සිට 15 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දක්වෙන වරණය තෝරන්න.

(13) මවුපියන්ගේ දේපොළවල ප්‍රවේණිය හිමි වනුයේ ඔවුන්ගේ දරුවන්ට ය.

(1) නීතිමය උරුමය (2) පාරම්පරික අයිතිය

(3) ආවේණික ප්‍රතිලාභ (4) නීත්‍යානුකූල වරප්‍රසාදය

(14) හොඳින් ඉගෙන ඉහළ වෘත්තීන්හි නිරත දරුවන්ගේ විප්‍රවාසය නිසා බොහෝ මධ්‍යම පාන්තික වියපත් දෙමාපියෝ අසරණ ව සිටිති.

(1) පිටරට වාසය (2) නොසලකා හැරීම (3) අඩත්තේට්ටම (4) පිට මං කිරීම

(15) යටිතල පහසුකම් පුළුල් වීම ආයෝජන ඉහළ නැංවීමට හේතු වෙයි.

(1) යෝජිත ඉලක්ක කරා ගමන් කිරීම (2) මුදල් ඉතිරි කිරීමට යොමු වීම

(3) ආර්ථික අරමුණු ජය ගැනීම (4) ව්‍යාපාර සඳහා මුදල් යෙදවීම

(16) (A) කොටසෙහි දක්වෙන විභක්තිවල අනුපිළිවෙළට අනුව (B) කොටසේ යටින් ඉරි ඇඳි වචන ඇතුළත් වාක්‍යවල නිවැරදි ගැළපීම සහිත වරණය කුමක් ද?

| (A) | (B) |
|---|---|
| • කර්ම විභක්තිය | E පැසුණු <u>හිසින්</u> බුහුමන් ලබව |
| • අවධි විභක්තිය | F මහු <u>දෙවියකු</u> සේ මට පිහිට විය |
| • කරණ විභක්තිය | G <u>ගහේ</u> කටු උල්කළ මනා ද? |
| • සම්බන්ධ විභක්තිය | H <u>මල්වලින්</u> සුවඳ විහිදෙයි |

(1) F, H, E, G (2) E, G, H, F (3) F, E, H, G (4) E, G, F, H

(17) උපසර්ගයක් රහිත පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) පිරිසිදු, සුමන, පරාජය, අනුබල (2) සම්මාන, සුවිසල්, කුරිරු, නියුතු

(3) දුමන, අත්‍යවශ්‍ය, සන්නාම, කුකවි (4) අධිබල, අනල්ප, පරිවාර, ඉවහල්

(18) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ද ඇතුළත් වරණය තෝරන්න.

(1) සිල්වත් - ශික්ෂාකාමී, පේශල, ශීලවන්ත, සුසිල්

(2) අපහාස - අගරු, නින්දා, අවමන්, ගර්හා

(3) සිංහයා - මිගිඳු, ගජිඳු, කෙසරිඳු, බාසුරු

(4) සුදුසු - යෝග්‍ය, අර්හ, ඉණංගු, උචිත

(19) විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) ප්‍රහර්ෂ - පරිදේව (2) සමක්ෂ - පරෝක්ෂ

(3) ආමන්ත්‍රණ - නිමන්ත්‍රණ (4) අශ්ලීල - ශිෂ්ට

(20) මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදයක් ද සහිත වරණය තෝරන්න.

(1) කෘදන්ත - පිනුම්, කියමන්, විමසීම්, සැලකිලි

(2) සමාස - නෙතුපුල්, සරාසඳ, තිනෙත්, නොමිනිස්

(3) විශේෂණ - හොඳින්, නැවුම්, සපුරා, බියකරු

(4) තද්ධිත - පැළැටි, අමතර, සංහිඳියා, කාබනික

mathematics.lk

(21) එක් එක් පේළියේ දී ඇති පදවලට සමානාර්ථ යෙදුම් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

(1) ප්‍රාචීන-නැගෙනහිර, ප්‍රජාව-ජනයා, ආර්ත-වැඩිහිටි, විලික්සුණු-ඉදුණු

(2) අධිවාසනා-ඉවසීම, පෘෂ්ඨය-තලය, චුම්බිත-සිඹින ලද, අසේව-වෙහෙසව

(3) නිරවුල්-වියවුල්, මෙරමා-තමන්ගේ, පෘෂ්ඨි-හැටඅට, වෙහෙල්-විහාර

(4) වණින්-පැහැයෙන්, උක්තීන්-කියමන්, ආපත්ති-පැමිණීම, පාදප-වෘක්ෂ

(22) (අ), (ආ) කොටස් යටතේ දක්වෙන පොදු ව්‍යවහාර හා ජන ව්‍යවහාර වඩාත් නිවැරදි ව එකිනෙකට ගැළපෙන වරණය තෝරන්න.

(අ)

A දල් අදින්නා, ගමන් මල්ල

B පුල්ලයාර් දෙවියා, උදල්ල

C ඇඳුත්තේ නායකයා, පිහිය

D ධීවර නායකයා,තුඹගස

(ආ)

E මරක්කලහේ, හැත්

F මුදුනා, කපන්නාව

G අම්බාවා, සැහැල්ලුව

H කිරිමුත්තා, අත්බරුව

(1) A-F (2) C-E (3) D-G (4) B-H

* අංක 23 සිට 25 තෙක් ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

(23) "දෙවේලේ දකින කුකුළාගෙ කරමලය සුදුයි"

(1) යමක් නිතර නිතර දැකීමෙන් එය ඇසට හුරුපුරුදු වන බව

(2) නිතර දැකීමෙන් යමක අගය අඩු වන බව

(3) යම් දෙයක් නිරතුරුව දැකීමෙන් එහි පැහැය වෙනස්ව යනෙන බව

(4) කුකුළාගේ කරමලය සැබැවින් ම සුදු පැහැ බව

(24) "බල්ලාගේ වැඩය බූරුවා බාර ගත්තා වගෙයි"

(1) අනුන්ගේ වැඩ බාර ගන්ට ගොස් විපතට පත් වීම

(2) තමන්ට අයිති වැඩ අතහැර වෙනත් කටයුතුවල යෙදීම

(3) නුහුරු කාර්යයන් බාර දී වෙහෙසට පත් කිරීම

(4) ප්‍රශංසා ලැබීමට ගොස් දුෂ්කරතාවට ලක් වීම

(25) "වාගේ දත් ඇත්නම් යකඩ පොලු වුණත් කන්ට පුළුවන්ලු"

(1) යකඩ පොලු කෑමට නම් වාගේ දත් තිබිය යුතුය

(2) සවිමත් දත් දෙපළකින් සිරුරට ආරක්ෂාවක් ලැබේ

(3) ශක්තිය, බලය ඇත්නම් නොකළ හැකි දෙයක් නැත

(4) දත් ශක්තිමත් නම් රළු ආහාර පවා විකා දැමිය හැකිය

(26) හැම පදයක ම ඌෂ්මාක්ෂරයක් යෙදුණු පද පේළිය තෝරන්න.

(1) වහර, වයස, තිදස, රුචිය

(2) වදන, අශුභ, කොහොඹ, කරුණ

(3) මිහිර, යසස, දවස, මුදල

(4) දසත, විෂම, සමග, ශපථ

mathematics.lk

(33) උපමාවක් රහිත පද්‍යය තෝරන්න.

(1) අඹරස වන් අඹ රස මුදිමින් සිනිඳු
(2) දිසි යළ පබළ කලඹෙර ලෙළ තරඟ පිට
(3) අතුළ කුසුම් විලසින් හැදෙන තුරු වැළ
(4) පතසන් අවරගිරි තැටියෙන් වැටෙන කල

(34) මුල් තීරුවේ දක්වෙන පාඩම හා කර්තෘයාට අනුව දෙවන තීරුවේ ප්‍රකාශ පෙළ ගැස්වීමේ දී නිවැරදි අනුපිළිවෙළ තෝරන්න.

| | |
|---|---|
| A වතුරමල (සිරිමාන්න) | E "උඹලගෙ අප්පච්චිට මං ඉගැන්නුව වගේ තමයි" |
| B කොරොක්කෝව (ර්යෝනෙයි) | F "අර මිනිස්සුන්ටත් වතුර තිබහ ඇති තමයි" |
| C මං නතන්නෙ (මහේන්ද්‍ර) | G "කෙරිල තියෙන්නෙ නම් බොහොම නරක වැඩක්?" |
| D කල මල පිපිලා (රංජරණ) | H "යාළුවා මාත් තල්පු කරන්න උදවු වෙන්න ද?" |

(1) GHFE (2) FHGE (3) EHFG (4) HEFG

(35) පහත දක්වෙන කර්තෘකාරක වාක්‍යයේ නිවැරදි කර්මකාරක ස්වරූපය ඇතුළත් වරණය තෝරන්න.

කුඩා දරුවෝ දෙදෙනෙක් ආරාධිත අමුත්තන් පිළිගත්හ.

(1) කුඩා දරුවන් දෙදෙනෙක් විසින් ආරාධිත අමුත්තෝ පිළිගන්නා ලදහ
(2) කුඩා දරුවන් දෙදෙනෙක් විසින් ආරාධිත අමුත්තෝ පිළිගැනුණාහ
(3) කුඩා දරුවන් දෙදෙනකු විසින් ආරාධිත අමුත්තෝ පිළිගනු ලැබූහ
(4) කුඩා දරුවන් දෙදෙනකු විසින් ආරාධිත අමුත්තන් පිළිගන්නා ලද්දෝය

(36) පහත දක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වරණය වන්නේ කුමක් ද?

"ඒ අය මාව හඳුනනවා කියලයි මම හිතුවෙ"

(1) ඔවුහු හා හඳුනති'යි මම සිතුවෙමි
(2) ඔවුන් මම හඳුනති'යි මා සිතුවෙමි
(3) ඔවුන් මම හඳුනතියි මම සිතුවෙමි
(4) ඔවුන් මා හඳුනති'යි මම සිතුවෙමි

(37) A B C D යටතේ දක්වා ඇති කෙටි වාක්‍ය තනි වාක්‍ය, බවට පත් කිරීමට යෙදිය හැකි නිපාත අනුපිළිවෙළ දක්වෙන වරණය තෝරන්න.

(1) ඔහු උත්සවට පැමිණියේ ය. රැඳී නොසිටියේ ය
(2) ඇතින්න වනය තුළට ගියා ය. පැටියා ද ඇයට එක් විය
(3) මම වියේ අසනීපයෙන් පසු වීමි. රැකියාවට නොගියෙමි
(4) පොළොන්නරුව පුලතිසිපුර නමින් ද හැඳින්වේ. එය පැරණි අගනුවරකි

E - හැවින් F - නමුත් G - කැටුව H - හෙවත්

(1) FGEH (2) FHGE (3) EFGH (4) HGFE

mathematics.lk

(27) වැරදි අදහසක් සහිත වාක්‍යය තෝරන්න.

(1) කෘදන්ත නාම පද ක්‍රියා පද ලෙස ද පෙනී සිටී
(2) අකර්මක ක්‍රියා සහිත වාක්‍ය ද කර්ම කාරක කළ හැකි ය
(3) ප්‍රකෘති ව්‍යංජනයකට ස්වර එක් කිරීම පිල්ලම් මගින් නිරූපිත ය
(4) "ඉ" නම් වූ තද්ධිත ප්‍රත්‍යය අර්ථ ගණනාවක යෙදේ

(28) පහත දැක්වෙන අකුරු ගැළපීමෙන් සාදා ගත හැකි අර්ථවත් නාමය සහිත වරණය තෝරන්න.

(1) වසින්තුව්ප (2) තුනයල්මතා (3) සයරිගිවෙස් (4) සිය්අයහරි

(29) (අ) තීරුවේ දැක්වෙන ක්‍රියා වර්ගය හා ගැළපෙන (ආ) තීරුවේ එන නිදසුන් වාක්‍යය සම්බන්ධ කෙරෙන නිවැරදි වරණය තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| A පූර්ව ක්‍රියා | E සැඳෑ අඳුර වැටෙද්දී අපි නිවෙසට ආවෙමු |
| B මිශ්‍ර ක්‍රියා | F නගරය පුරා විදුලි පහන් දල්වේ |
| C විධි ක්‍රියා | G ඉගෙනීමට වඩ වඩා උනන්දු විය යුතුය |
| D අසම්භාව්‍ය ක්‍රියා | H වසුපැටියා මවුදෙන හඬනු ඇසින |

(1) B-G (2) A-F (3) C-H (4) D-E

(30) දී ඇති වරණ අතුරෙන් පහත සඳහන් කවියේ හතරවන පදය තෝරන්න.

කමතේ කෙතේ හේනේ තනියට ඉන්නේ
තුසිතේ ඇතේ යන සොම්නස ගෙන දෙන්නේ
දෙනෙතේ සිතේ අමුතු මැ දේ අන්දන්නේ
..................................................................

(1) මෙහෙමද ජීවිතේ දිගට ම දිගට ම ගත වෙන්නේ
(2) විපතේ සෙතේ සම කයිසා බව දන්නේ
(3) ඔබ එනතුරා නැත මගෙ සිත සැනසෙන්නේ
(4) මා ගැන නොවෙද හිමි මේ හැටි වෙහෙසෙන්නේ

* අංක 31, 32 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

(31) (1) ඇතැමුන් ගී ගයද්දී සමහරු නැටූහ
(2) මහා සභාව පසුගියදා යළි රැස් වූවා ය
(3) සියල්ලෝ ම උත්සව ගැන කතා කළේ දැඩි සතුටිනි
(4) ඔබ පොත පත කියවා හොඳ උගතකු වන්න

(32) (1) ගුවන් යානා පෙළ සන්දර්ශනය වර්ණවත් කළහ
(2) විවිධ සංවිධාන අධ්‍යාපනයට රුකුල් දෙනු ලබයි
(3) ගිමන් හලෙහි කිසිවකු නිදා සිටිනු දක්නා ලැබිණි
(4) ඔබට කෙටි පණිවුඩයක් එවන ලද්දේ මමයි

mathematics.lk